ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2011 ජූලි - 10 ශ්‍රේණිය

Genaral Certificate of Education (Ord. Level) Examination, July 2011 - Grade 10

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I , II
வணிகக் கல்வியும் கணக்கீடும் I , II
Business and Accounting Studies I , II

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුළුව සියලු ම ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. සුරේන් විශ්‍රාමික රාජ්‍ය නිලධාරියෙකි. දිනක් ප්‍රිය සම්භාශණයක දී ඔහුගේ හොඳම පාසල් මිතුරිය වන සුරනි විශ්‍රාමික බැංකු කළමණාකාරිණිය හමුවිය. එහිදි ඇති වූ කතා බහක කොටසක් පහත දැක්වේ...

සුරේන් - ආ......... මම ගිය මාසේ විශ්‍රාම ගියා.. රු. 1,000,000 ක් ලැබුණා. බැංකු පොලියත් 5% යි. කිසිම වැඩක් නෑ....... මොකක් හරි ව්‍යාපාරයක් පටන් ගන්නයි හිතා ගෙන ඉන්නේ .....

සුරනි - මමත් ලබන මාසේ විශ්‍රාම යනවා. රු. 1,500,000 ක් පමණ මට ලැබෙයි... මමත් කැමති ව්‍යාපාරයකට .... රැකියා කරලා එපා වෙලා ....................

සුරේන් - මේ දවස් වල බැංකු පොලි අනුපාතය අඩු වෙලා නිසා මිනිස්සු ඉඩම් මිලදී ගන්න පටන් අරන්.... ඉඩම් අරගෙන විකුණන එක් හොඳ ව්‍යාපාරයක්...

සුරනි - ඔයාට මතක ද සුරත් ව.... එයා ගාව රු. 1,500,000 ක ඉඩමක් තියෙනවා..... එයත් සම්බන්ධ වෙන්න කැමතියි....

සුරේන් - ව්‍යාපාරය ආරම්භ කරන්න කලින් සැලැස්මක් හදා ගන්න වෙයි නේද ?

සුරනි - ඔව්, ඔව්... ඒක අපිට ගොඩාක් ප්‍රයෝජනවත්... අපි ජංගම ගිණුමකුත් විවෘත කරමු.... එතකොට චෙක් වලිනුත් ගනුදෙනු කරන්න පුලුවන්නේ .....

මොවුන් තිදෙනාම පමණක් එකතු වි 2011.04.01 දින ඔවුන්ගේ වගකිම ප්‍රාග්ධනයට පමණක් සිමා වන සේ අවම ලියවිලි යටතේ ඉඩම් කට්ටි කොට විකුණන ව්‍යාපාරයක් අරඹන ලදි. සුරත් විසින් ව්‍යාපාරයට යෙදු ඉඩම අප තබා බැංකුවෙන් 10% වාර්ෂික පොළියට රු. 1,000,000 ක ණයක් ලබා ගන්නා ලදි. ව්‍යාපාර කටයුතු සිදුකරගෙන යාමේ පහසුව තකා ඔවුන් රු. 100,000 තැන්පත් කොට ජංගම ගිණුමක් ද විවෘත කරන ලදි.

01. "බැංකු පොලි අනුපාතිකය පහල යන විට ඉඩම් වල මිල ඉහල යයි." මෙය පැහදිලි කරන්න.
02. මොවුන්ට ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
03. මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය හැඳින්වීමේ දී නමට යෙදිය යුතු විශේෂ පද ආදියක් වේ නම් ඒවා නම් කරන්න.
04. මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය ලියාපදිංචි කල යුතු පණත නම් කරන්න.
05. ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියවිලි 2ක් ලියන්න.
06. සුරත් විසින් ලබා ගත් බැංකු ණයෙහි වාර්ෂිකව ගෙවිය යුතු පොලිය කොපමණ ද?
07. සැලැස්මක අන්තර්ගත මූලික කොටස් 2ක් දක්වන්න.
08. සැලසුමක් සකස් කිරීම මගින් ව්‍යාපාරයකට ලැබෙන වාසි මොනවාද ?
09. මෙහි සඳහන් ආකාරයට ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය සම්පාදනය සිදුකර ඇති ආකාර 2 මොනවාද ?
10. ඔබ සිතන ආකාරයට මෙම ව්‍යාපාරයට බලපාන බාහිර පරිසරස සාධක මොනවාද ?

(ලකුණු 02 x 10 = 20 යි)

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න)

02. (i) ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව දළ දේශීය නිෂ්පාදනය බෙදා දක්වන්නේ කෙසේදැයි නම් කර ඉන් වැඩිම දායකත්වයක් ලබා දෙන්නේ කිනම් අංශය ද යන්න සඳහන් කරන්න.

(ii) ශ්‍රම විභජනය මහ පරිමාණ නිෂ්පාදනයේ ඇති විශේෂතම ලක්ෂණය වේ. මෙය පැහැදලි කරන්න.

(iii) අවශ්‍යතා හා වුවමනා යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(iv) ඍජු නිෂ්පාදනය හා වක්‍ර නිෂ්පාදනය යනු කුමක්දැයි පැහදලි කරන්න.

(v) හොඳ මුදලක ලක්ෂණ 4ක් නම් කරන්න.

(ලකුණු 02 x 05 = 10 යි)

03. (i) ව්‍යාපාර සංවිධාන අයිතිය මත වර්ග කෙරෙන ගැලීම් සටහන ඇඳ පෙන්වන්න.

(ii) පහත සඳහන් ව්‍යාපාර ලියාපදිංචි කළ යුතු පණත් නම් කරන්න.

- ❖ තනි ව්‍යාපාර
- ❖ හවුල් ව්‍යාපාර
- ❖ සමුපකාර
- ❖ සමිති සමාගම්

(iii) පහත සඳහන් ව්‍යාපාර සඳහා ලියාපදිංචියට අමතරව විශේෂ බලපත්‍ර ලබා ගත යුතු ආයතන නම් කරන්න.

- ❖ ජාත්‍යන්තර පාසල්
- ❖ කර්මාන්ත ශාලා
- ❖ බේකරි
- ❖ ගල් මෝල

(iv) හවුල් ව්‍යාපාරයකට ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති විට ලාභ අලාභ බෙදා ගැනීමේ දී ඇතිවන නීතිමය තත්වය පැහැදිලි කරන්න.

. (v) ණයකරයක් යනු කුමක් ද?

(ලකුණු 02 x 05 = 10 යි)

04. (i) ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ දී අවධානය යොමු කල යුතු අයිතමයන් මොනවාද?

(ii) W5 රාමුව නම් කරන්න.

(iii) සාගර පෙරේරා සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් කරගෙන යනු ලැබේ. 2012 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාස සඳහා අලෙවි කිරීමට අපේක්ෂිත නිෂ්පාදනය පිළිබඳ කරන ලද සමීක්ෂණයෙන් ලබා ගත් තොරතුරු පහත දැක්වේ.

- ❖ පිළිවෙලින් ඒකක 2000, 2500 හා 3000 බැගින් ඉදිරි මාස සඳහා අලෙවි කළ හැකි බව.
- ❖ විකුණුම් මිල ඒකකයකට රු. 15/- ක් වන අතර ඉදිරි මාස වලදී රු. 2/- බැගින් ඉහල යන බව.
- ❖ මාසික වියදම ඒකකයකට රු. 7/- කි. මෙය මාසිකව රු. 3/- බැගින් ඉහල යන බව.

මාසික අලෙවි සැලැස්මක් පිළියෙල කරන්න.

(ලකුණු 10)

05. එක්තරා නිෂ්පාදන ආයතනයකින් 2010.12.31 දිනට උපුටා ගන්නා ලද ශේෂයන් කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| 2010.01.01 අමුද්‍රව්‍ය තොග | රු. 16,200 |
| යන්ත්‍ර ක්ෂය | රු. 5,000 |
| ඉන්ධන හා බලය | රු. 9,000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | රු. 12,100 |
| සෘජු නිෂ්පාදන වැටුප් | රු. 7,300 |
| කම්හල් රක්ෂණය | රු. 6,300 |
| 2010.12.31 අමුද්‍රව්‍ය තොග | රු. 4,500 |
| කම්හල් වේතන | රු. 8,600 |
| නිෂ්පාදන ඒකක ගණන | 1000 |
| ලාභාංතිකය | 20% |

ඔබ විසින් මෙහෙයුම් සැලැසුමක් පිළියෙල කොට මේවා සොයන්න.

1. සෘජු ද්‍රව්‍ය පිරිවැය
2. ඒකකයක් නිපදවීමට ගිය පිරිවැය
3. ඒකක විකුණුම් මිල
4. මුළු ලාභය සොයන්න.

(ලකුණු 10)

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර විසින් සම්පාදිත යි.